ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

Article 12(1)

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date } 2019/07/19 |

පැමිණිලිකරු : ටී.බී. සේමසිංහ මයා.
අංක 412/03/60 A.
දළඳ පුර. ගාලදිවුල්වැව.

වගඋත්තරකරුවන් : 01 සාමාන්‍යාධිකාරී.
පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.
අනුරාධපුර.

02. පරිපාලන නිලධාරී.
පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.
අනුරාධපුර.

<u>පැමිණිලි අංකය</u> :- ***HRC/AP/230/2016(S)***

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා අනියම් කම්කරු පාලක වශයෙන් වසර 09 ක් උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කරමින් සිටියදී 2014 වසරේ ස්ථිර පත්වීමක් ලබාදුන් නමුත් එම පත්වීම නැවත අහෝසි කරන ලද බවත්, එහිදී නැවත ආයතනයේ ස්ථිර පත්වීමකට ඉල්ලුම් නොකරන බවට ලිඛිත පොරොන්දුවක් ලබා ගැනීමත්, ද්වේශ සහගත ලෙස මසක කාලයක් සේවා බණ්ඩණය කිරීමත් හේතුවෙන් පැමිණිලිකරුට අසාධාරණයක් සිදුවී ඇති බවත්ය.

වගඋත්තරකරුගේ ප්‍රකාශය :-

වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ, 25/2014 හා 25/2014(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව පැමිණිලිකරුගේ සේවය ස්ථිර කිරීමට නම් දින 180ක



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail } sechrc@gmail.com

අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කලයුතු බවත්, පැමිණිලිකරු සේවයට බඳවා ගැනීමේදී විධිමත් පත්වීමේ ලිපියක් ලබාදී තිබිය යුතු බවත්ය.

ඒ අනුව මෙම පැමිණිලිකරු අඛණ්ඩ දින 180 සම්පූර්ණ කර නොමැති අයෙකු ලෙස හඳුනාගෙන ඇති බවත්, ඔහුට විධිමත් පත්වීමේ ලිපියක්ද නොමැති බවත් ඔහුගේ සේවා ඛණ්ඩණයක් සිදුකර ඇති බවත් එබැවින් සේවයේ ස්ථිර කළ නොහැකි බවත් සඳහන් කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය :-**

මෙම පැමිණිල්ලට අදාළව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් සිදුකර ඇති අතර, එහිදී ඉදිරිපත් වී ඇති කරුණු අනුව තත්කාර්ය පදනම මත 2008.03.11 දින සිට වැඩ පරිපාලකවරයෙකු ලෙස පැමිණිලිකරුව සේවයේ යොදවා ඇති බව නිරීක්ෂණය වේ.

තවද "කම්කරු පාලක (II ශ්‍රේණිය) තනතුරට පත්කිරීම" හිසින් යුතුව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් පැමිණිලිකරු වෙත යොමුකර ඇති 2014.01.19 දිනැති ලිපිය අනුව පැමිණිලිකරු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කම්කරු පාලක (*II* ශ්‍රේණිය) තනතුරට පත් කර ඇති බවද නිරීක්ෂණය වේ.

එසේම 25/2014 චක්‍රලේඛය අනුව අදාළ සුදුසුකම් සපුරා නැතැයි විගණනය පෙන්වා දීම මත පැමිණිලිකරුගේ පත්වීම අවලංගු කිරීමට කටයුතු කරන බවට 2015.06.15 දිනැති ලිපිය මඟින් දන්වා ඇති අතර, 2015.09.18 දිනැති ලිපිය මඟින් පැමිණිලිකරු තත්කාර්ය පදනම මත නැවත සේවයට බඳවාගෙන ඇති බවද නිරීක්ෂණය වේ.

විගණන විමසුමෙන් පෙන්වා ඇති 25/2014 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයට අනුව අදාළ සුදුසුකම් සපුරා නැති අයගේ පත්වීම් අවලංගු කරන බවට සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සභාපති, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත හා විගණන අධිකාරී වෙත 2015.03.26 දිනැති ලිපිය මඟින් දන්වා ඇති අතර, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින්ද 2015.04.20 දිනැතිව 25/2014 හා 25/2014$(ii)$ චක්‍රලේඛන අනුව සුදුසුකම් පැහැදිලි කර සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, උතුරුමැද පළාත වෙත ලිපියක් යොමුකර ඇති බවද නිරීක්ෂණය වේ.

දින 180ක අඛණ්ඩ සේවා කාලය සපුරා ඇති සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රධානය කලයුතු වුවත්, සේවා ඛණ්ඩනයට භාජනය වී සිටි සේවකයින්ට ස්ථිර පත්වීම් ලබා දුන් බවට වූ විගණන වාර්තාව කොමිෂන් සභාවේ අවධානයට යොමුකොට ඇත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 යටතේ සේවකයින් ස්ථිර කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2016.01.05 දිනැතිව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමුකර ඇති ලිපියේ පිටපතක්ද කොමිෂන් සභාවේ අවධානය පිණිස ඉදිරිපත් කර ඇත.

එසේම පැමිණිලිකරු දින 180ක සේවා කාලය සපුරා ඇති බවට සහතික කරමින්. සාමාන්‍යාධිකාරී. උතුරු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2017.05.08 දිනැති ලිපිය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරු තම පැමිණිල්ල මඟින් ප්‍රධාන කොටම සඳහන් කර ඇත්තේ, 2008.03.04 දිනැති ලිපිය මඟින් තමාව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තත්කාර්ය පදනම මත වැඩ පාලකවරයෙකු ලෙස බඳවා ගත් බවත්, 2014.11.19 දිනැති ලිපිය මඟින් 2014.10.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි කම්කරු පාලක (*II* ශ්‍රේණිය) තනතුරට පත් කරන තෙක්ම අඛණ්ඩව සේවා බණ්ඩනයක් නොමැතිව සේවයේ යෙදුනු බවත්ය.

එමෙන්ම මෙම පත්වීම තමා වෙත ලැබී ඇත්තේ දින 180ක සේවා කාලයද සහිතව 25/2014 දරණ චක්‍රලේඛයේ දක්වා ඇති සියලු සුදුසුකම් සපුරා සිටි නිසාවෙන් වන නමුත් අංක 25/2014 දරණ චක්‍රලේඛනය අනුව තමන් වෙත ලද ස්ථිර පත්වීම 2015.06.15 දිනැති ලිපිය මඟින් අහෝසි කළ බවත් දක්වා ඇත.

එමෙන්ම මෙම පත්වීම අහෝසි කර නැවත සේවා බණ්ඩනය කරමින සේවයේ අවශ්‍යතාවය මත නැවත සේවයේ යෙදවීම සඳහා 2015.09.18 දිනැති ලිපිය පැමිණිලිකරු වෙත යොමුකර ඇත.

වගඋත්තරකරුවන්ගේ ප්‍රධාන තර්කය වන්නේ, 25/2014 චක්‍රලේඛයට අනුව පැමිණිලිකරු දින 180ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර නොතිබීම මත සහ පැමිණිලිකරුට විධිමත් පත්වීම් ලිපියක් නිකුත් වී නොතිබිම හේතුවෙන් පැමිණිලිකරුගේ සේවය ස්ථිර කළ නොහැකි බවයි.

මෙම පැමිණිල්ල සම්බන්ධව කොමිෂන් සභාව විසින් සිදුකරන ලද පරීක්ෂණයට අනුව. පැමිණිලිකරු 2013.01.08 දින සිට 2014.10.24 දින දක්වා අඛණ්ඩව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කර ඇති බවට තොරතුරු අනාවරණය වී ඇත. ඒ අනුව මෙම පැමිණිලිකරු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අඛණ්ඩව දින 180 සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අයෙකු බව නිරීක්ෂණය වේ.

මෙම පැමිණිලිකරුට ස්ථිර පත්වීමක් ලබා නොදිමට තවත් හේතුවක් ලෙස දක්වා ඇත්තේ. පැමිණිලිකරු වෙත විධිමත් පත්වීම් ලිපියක් නිකුත් වී නොතිබීම වේ. මෙම පැමිණිලිකරු 2013.01.08 දින සිට 2014.10.24 දින දක්වා අඛණ්ඩව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කර ඇති බවට වගඋත්තරකරුවන් විසින්

පිළිගෙන තිබීම අනුව හා මෙම පැමිණිලිකරු වෙත 2008.03.11 වන දින තත්කාර්ය පදනම මත පත්වීම් ලිපියක් නිකුත් වී තිබීමද තුළින් පැමිණිලිකරු වසර ගණනක් ආයතනයේ සේවය කර ඇති අයෙකු බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු වෙත විධිමත් පත්වීම් ලිපියක් නිකුත් කර නොතිබීම යන කරුණු පැමිණිලිකරුට අදාළ කරුණු නොවන හෙයින් එම කරුණ මත පදනම්ව 25/2014 චක්‍රලේඛනයේ සඳහන් සුදුසුකම් සපුරා සිටින පැමිණිලිකරුට ස්ථිර පත්වීමක් ලබා නොදී සිටීමට සාමාන්‍යාධිකාරීවරයා විසින් ගෙන ඇති තීරණය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් පැමිණිලිකරු වෙත හිමිව ඇති " නීතිය පසිඳලීම සහ නීතිය ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකරු වෙත මුල් අවස්ථාවේදී පත්වීම් ලබා දුන් 2014.10.24 දින සිට බලපැවැත්වෙන පරිදි පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කම්කරු පාලක (II ශ්‍රේණිය) තනතුර නැවත ලබා දීමටත් එම කාල සීමාවට අදාළ හිඟ වැටුප් ලබා දීමටත් පියවර ගත යුතුය.

2019.09.02 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/